**ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ජූලී චංග් මහත්මිය විසින්**

**එක්සත් ජනපද - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් (Fulbright) කොමිෂන් සභාවේ 70 වැනි සංවත්සරය සමරන අවස්ථාවේ පල කරන ලද අදහස්**

**2022 නොවැම්බර් 16**

ශ්‍රී ලංකාවේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, සම්භාවනීය අමුත්තනි, එක්සත් ජනපද - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයිනි, ගෞරවනීය ෆුල්බ්‍රයිට් ආදිසිසුනි, හවුල්කරුවනි, මිත්‍රවරුනි, සුභ සන්ධ්‍යාවක් වේවා.

මේ සතිය අප දෙරටේ ජාතික ෆුල්බ්‍රයිට් කොමිෂන් සභාවේ 70 වැනි සංවත්සරය සනිටුහන් කරනවා. 1952 නොවැම්බර් 17 වැනි දින අප දෙරටේ රජයන් කෙටි කාලීන ෆුල්බ්‍රයිට් හුවමාරු වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කරනු ලැබුවා. ඊට දොලොස් වසරකට පසු, 1964 දී, එ.ජ. තානාපති ෆ්‍රාන්සස් විලිස් සහ ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍ය ආචාර්ය එන්. එම්. පෙරේරා එම හුවමාරු වැඩසටහන අලුත් කිරීම සහ ස්ථිර වැඩසටහනක් බවට පත් කිරීම සඳහා වූ ගිවිසුමකට සම-අත්සන් තැබුවා. අපගේ පූර්වගාමීන්ගේ දූරදර්ශීභාවයට ස්තූතිවන්ත වන්නට, එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ හවුල්කාරිත්වය සහ කැපවීම ශක්තිමත්ව පවතිනවා. ෆුල්බ්‍රයිට් වැඩසටහන හරහා දහස් ගණනකට අප දෙරටේ ඉගෙනීමට සහ ජීවත් වීමට, දැනුම බෙදා ගැනීමට, වෘත්තීය සබඳතා වර්ධනය කර ගැනීමට සහ ජීවිත කාලය පුරාම පවත්නා මිත්‍රත්වයන් වර්ධනය කර ගැනීමට වටිනා අවස්ථාව ලැබී තිබෙනවා. ඔවුන් ධනාත්මක වෙනසක් ඇති කරන්නේ මෙම සම්බන්ධතා හරහායි. ෆුල්බ්‍රයිට් ආදි ශිෂ්‍යයින් 40 දෙනෙකු රාජ්‍ය නායකයින් ලෙස කටයුතු කර ඇති අතර 62 දෙනෙකුට නොබෙල් ත්‍යාගය පිරිනමා ඇති බව ඔබ දන්නවාද? මේ වැඩසටහනේ වැදගත්කම විදහා දැක්වීමට ඔබ සමගින් බෙදාහදා ගතහැකි සාර්ථකත්වයේ කථා රාශියක් තිබෙන නමුත් කථා දෙකක් ගැන මේ අවස්ථාවේ මා සඳහන් කරනවා.

මේ සැන්දෑවේ අප සමගින් එක්ව සිටින ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක ගැන ඔබට කියන්නට මා කැමතියි. මහාචාර්යතුමියනි, නැවතත් ඔබ දකින්නට ලැබීම සතුටක්. ආචාර්ය ප්‍රදීපා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ මහාචාර්යවරියක් වන අතර කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය වනවා. ඇය "ද්විත්ව ෆුල්බ්‍රයිට්ධාරිනියක" යැයි හඳුන්වන්නට පුලුවනි. එනම්, 2005 දී පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්වය දිනා ගැනීමෙන් පසුව ඇ ඩේවිස් හි කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ එක් උපාධියකට නොව උපාධි දෙකකට එකවර බැඳී තිබෙනවා. ඇයත් මා වැනි ම අදහස් ඇති කාන්තාවක්. ඇය ෆුල්බ්‍රයිට් කාලය තුළ උද්‍යාන විද්‍යාව සහ ශෂ්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ජෛව තාක්ෂණය පිළිබඳ අවධාරණය වන ශාක ජීව විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ගෙන තිබෙනවා. මට AgBiotech මධ්‍යස්ථානයේදී මහාචාර්ය ප්‍රදීපා

මුණගැසුණු අතර එහිදී මම ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයට එම විද්‍යාගාරය සහාය දෙන ආකාරය පිළිබඳ දැන ගත්තා. ශ්‍රී ලාංකීය ගොවීන්ට සහ ජනතාවට මෙරටේ වගා කරන ආහාර  කෙරෙහි විශ්වාසය තැබීමට මෙම නවීනතම ජෛව ආරක්ෂණ විද්‍යාගාරය හැකියාව ලබා දෙනවා. අද පවතින ගෝලීය ආහාර හිඟයට එය කෙතරම් තීරණාත්මක දැයි මම ඔබට අමුතුවෙන් පැවසිය යුතු නැහැ. මහාචාර්ය ප්‍රදීපාගේ මඟපෙන්වීම යටතේ, මෙය සහ AgBiotech මධ්‍යස්ථානයේ තවත් ව්‍යාපෘති කිහිපයක් හරහා, සාක්ෂි මත පදනම් වූ, දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ ගැනීමට සහ නිෂ්පාදන සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව ශක්තිමත් කරනවා. නමුත් මේ සුවිශේෂී කාන්තාවට එය ප්‍රමාණවත් නැහැ! මීළඟ පරම්පරාවේ විද්‍යාඥයින් සහ පර්යේෂකයන් තුළ වෙනසක් කරමින් ඇය මේ වන විට ආචාර්ය උපාධි සිසුන් හය දෙනෙකු සහ ශාස්ත්‍රපති උපාධි සිසුන් හත් දෙනෙකු අධීක්ෂණය කරන්නේ ඇයගේ මගපෙන්වීම යටතේ ඉගෙනුම ලැබූ සහ දැන් ශ්‍රී ලංකාවේ අධ්‍යයන හා විද්‍යාත්මක ප්‍රගතියට දායක වන සිසුන්ගේ දිගු ලැයිස්තුවට තවත් නම් එකතු කරමින්. ලෝකයට හොඳ ප්‍රවෘත්ති අවශ්‍ය මෙවැනි කාලයක, වියහැකි බොහෝ විභවයන්ගෙන් අනාගතය පිරී පවතින බවත් බොහෝ අවස්ථාවලදී අනාගතය දැනටමත් උදා වී ඇති බවත් ආචාර්ය ප්‍රදීපා මට පෙන්වා දුන්නා. ආචාර්ය ප්‍රදීපා වැනි විද්වතුන් පරම්පරා ගණනාවක් මුලුල්ලේ ෆුල්බ්‍රයිට් අත්දැකීමේ වටිනාකම ඔප්පු කරන අතර ම ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ඊළඟ පරම්පරාව පෝෂණය කරමින් ඇය එය ඉදිරියට ගෙවමින් සිටිනවා.

අනාගතය ගැන කථා කිරීමේදී මා මීළඟ පරම්පරාවේ අධිශිෂ්‍යත්වලාභීන් ගැන සඳහන් කරන්නට කැමතියි. කීරා පෝස්ට් යනු KDU හි දකුණු මණ්ඩපයට අනුයුක්ත කර ඇති ෆුල්බ්‍රයිට් ඉංග්‍රීසි ගුරු සහායිකාවක්. කීරා, ඔබ නැවතත් දකින්නට ලැබීම සතුටක්. වසංගතය නිසා ඇගේ ශ්‍රී ලංකා ගමන මදක් පමා වුවත් උපාධි අපේක්ෂකයින්ට ඉංග්‍රීසි බස ඉගැන්වීමේ කටයුතු සඳහා ඇය ඉක්මනින් හැඩ ගැසී තිබෙනවා. අප දන්නා පරිදි අධ්‍යාපනික සාර්ථකත්වයට, රැකියාවක් ලබාගතහැකිකම වැඩි කරන්නට, සහ කලාපීය හා ජාත්‍යන්තර වෙළඳපලේ අවශ්‍යතා සපුරාලන්නට ශ්‍රී ලංකාවට ඇති හැකියාව වැඩිදියුණු කරන්නට ඉංග්‍රිසි භාෂා දැනුම එක් හේතුවක් වනවා. එමෙන්ම, මේ දිවයින මුලුල්ලේ, ඉන්දු ශාන්තිකර කලාපයේ සහ ලෝකයේ ම ප්‍රජාවන් ඉංග්‍රිසි භාෂාව හරහා එක් කරනවා. ඒ විශේෂ ඵලප්‍රයෝජනයට අමතරව, කීරාගේ ඇමරිකානු අත්දැකීම් ඇගේ ඉගැන්වීමේදී සහ පන්ති කාමරයෙන් පිටත සමාජ ජීවිතයේදී ගැඹුරක් එක් කරනවා. එක්සත් ජනපදයට යන ශ්‍රී ලාංකික ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වධාරීන් මෙරට අනර්ඝ සංස්කෘතික උරුමය, සම්ප්‍රදායන් සහ ඉතිහාසය පිළිබඳව දැනුවත් කරන්නාක් සේම, කීරා වැනි සිසුන් ඔවුන්ගේ පුද්ගලික ඉතිහාසය, විවිධත්වය හා සර්වග්‍රහණය පිළිබඳ ඔවුන්ගේ අදහස්, ඇමරිකාවේ නූතන ජීවිතය ගැන අත්දැකීම්, මෙරටට ගෙන එනවා. 2022 මුල් කාලයේදී ඇය මෙරටට පැමිණීමෙන් මද කාලයකට පසුව ආර්ථික සහ දේශපාලන අර්බුදය මධ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවෙන ආකාරය කීරා දුටුවා. ඇගේ ශ්‍රී ලාංකික සිසුන් සහ මිතුරන් අතරේ ජීවත් වෙමින් ඇය සෘජුවම ලැබූ මේ අත්දැකීම් එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ යන දෙරටේම ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, සාමකාමී විරෝධතා සහ

ඒකාබද්ධතාවය හා ආර්ථික සර්වග්‍රහණය සඳහා වන විසඳුම් පිළිබඳ විවෘත සංවාද සඳහා මග පාදා දුන්නා. ෆුල්බ්‍රයිට් හරහා නිර්මාණය වන මිත්‍රත්වයේ සුන්දරත්වය එයයි. අභියෝග සහ සාර්ථකත්වය ගැන විවෘතව කථා කිරීමට මිතුරන්ට හැකි වනවා. ෆුල්බ්‍රයිට් හුවමාරු වැඩසටහනට ස්තුතිවන්නට, අපගේ ද්වි-ජාතික කොමිෂන් සභාවේ සහ හවුල්කරුවන්ගේ සහය ඇතිව ශ්‍රී ලංකාවේ සිටින සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටින අපගේ ෆුල්බ්‍රයිට් සිසුන්ට ශාස්ත්‍රඥ නිදහස සහ අව්‍යාජත්වය ඇතිව එසේ කිරීමට හැකි වී තිබෙනවා.

ෆුල්බ්‍රයිට් හුවමාරු වැඩසටහන සහ එහි බලපෑම පිළිබඳව මා අතිශයින් කෘතඥ වනවා. පසුගිය වසර 70 ක දෙපසට ම දිවෙන සාර්ථක  සංස්කෘතික හා ශාස්ත්‍රීය හුවමාරුව එක්සත් ජනපද - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසමෙන්, එහි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දැවැන්ත උත්සාහය නිසා සිදු වූ බවට සැකයක් නැහැ. අපගේ අඛණ්ඩ සාර්ථකත්වය සහ හවුල්කාරිත්වය ඉදිරියටත් දැකගැනීමට අප බලාපොරොත්තු වනවා. ඔබට ස්තුතියි.